බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- 30 /2016

මගේ අංකය :- බ12/08/වා.හා.ස/2016/16
බන්ධනාගාර මූලස්ථානය,
2016-11-22.

සියළුම මාණ්ඩලික නිලධාරීන්,
සියළුම බන්ධනාගාර අධිකාරීන්, සහකාර බන්ධනාගාර අධිකාරීන්.

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ - 2016 වර්ෂය**

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේඅංක PFD/RED/03/03/01 හා 2016.03.31 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ අංක 05/2016 පරිදි වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය පහත පරිදි නිම කළ යුතු බව කාරුණිකව දන්වා සිටිමි.තව ද මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව රජ සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් , බඩු බාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව පවත්වාගැනීම හා සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් හා විධිමත් විධිවිධාන යොදනු ලබන බවට හා ඒවා වරින් වර සත්‍යාපනය කරණු ලබන බවටත් ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරණු ලබන කල් හි එසේ නිෂ්කාෂණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස් වලට අනුකූලව කරණු ලබන බවටත් සෑහීමකට පත් විය යුතුය.එසේම මු.රෙ.128 (1) (ඉ) වගන්තිය අනුව භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින තොරතුරු ප්‍රකාශ හා සමීක්ෂණ වාර්තා නිවැරදිව හා කලට වේලාවට ඉදිරිපත් කළ යුතුය.

1. 2017.03.15 දිනට පෙර භෞතිකව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීම.
2. 2017.03.31 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණය අවසන්කර වාර්තාව මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම .
3. 2017.04.15 දිනට පෙර සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත සසඳා වාර්තා කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
4. 2017.04.30 දිනට පෙර පොදු 47 වාර්තාවට අනුව විනාශ කළ යුතු භාණ්ඩ විනාශ කිරීම,අළුත්වැඩියා කළයුතු භාණ්ඩ අළුත්වැඩියාව, වෙන්දේසි කළයුතු භාණ්ඩ වෙන්දේසි කිරීම හා වෙනත් රජාය් ආයතනවලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කර අවසන් කිරීම.
5. 2017.06.15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
6. අපහරණය කරණ ලද වත්කම් පිළිබද තොරතුරු, 2006.07.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 422 හි ඇමුණුම් ප්‍රකාරව ලේඛණගත කර 2016-12-31 දිනට පවතින වත්කම් පිළිබද වාර්තාව සමීක්ෂණ වාර්තා සමග රාජ්‍ය මුදල් අධ්‍යකෂ ජනරාල් වෙත වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කිරීම.

ඉහත කාලසටහන අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරීම වෙනුවෙන් එම කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් කර ඇති ලිපි, චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳව ද දැඩි අවධානය යොමු කරණ මෙන් කාරුණිකව දන්වමි.( මෙම චක්‍රලේඛය සමග පහත චක්‍රලේඛයන් ද දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙන් බාගත කරගත හැකිය).

- බන්ධනාගාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ - අංක 26 / 2016 - 2016-10-25
- බන්ධනාගාර,ප්‍රතිසංස්කරණ,පුනරුත්තාපන,නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ අංක MPRRH/06/06/01/09 දරණ ලිපිය. - 2016.07.07
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංක පිඑෆ්/439 - 2009-07-21
- රාජ්‍ය මුදල් චක්‍රලේඛ - අංක 422 - 2006-07-30

- තොග භාණ්ඩ සම්බන්ධයෙන් කපා හැරීම හා ඉවත් කිරීමට ඉදිරිපත් කිරීමට පෙර මු.රෙ.101 සිට 109 දක්වා විධිවිධාන අනුගමනය කර තිබිය යුතුය.

තව ද ,

- 2016 වසර අවසන් වන තුරු නොසිට අදාල ආකෘතිපත්‍ර ලබාගෙන නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී නිම කළ හැකි සියළුම කටයුතු නිම කිරීමට අදාල උපදෙස් ලබාදෙන්න.සාමාන්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අමතරව කාර්මික හා කෘෂිකාර්මික අත්තිතාරම් ගිණුමට අදාලව භාණ්ඩ සමීක්ෂණයේදී ද භාණ්ඩාගාර 66 ආකෘතියේ සම්පූර්ණ කර තිබිය යුතුවේ. තව ද සුභසාධක ගිණුමට අදාලව ආකෘති වෙනම සකස් කළ යුතුවේ.
- පිටපත් 05 කින් සකස් කරණ ලද භාණ්ඩාගාර 66 ආකෘතිපත් වලින් එක් පිටපතක් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත 2017-01-05 වැනි දිනට පෙර යොමු කළ යුතු වේ.
- මෙ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කළ යුතු ආකාරය දැක්වෙන, බන්ධනාගාර කොමසාරිස්(මුදල්) වෙතින් ලබාදෙනු ලබන අමතර ලිඛිත උපදෙස් අවශ්‍ය අවස්ථාවන් හිදී අදාල නිලධාරීන්ට ලබාදීමට කටයුතු කළ යුතු වේ.

එච්.එම්.එන්.සී.ධනසිංහ,

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.

පිටපත්:- 01. විගණකාධිපති - දැ.ග.ස.

02. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් - දැ.ග.ස.